PRESS RELEASE

# MMDA ප්‍රතිසංස්කරණ පිළිබඳව NPP ආණ්ඩුවේ ප්‍රකාශයට, ආර්ථික යුක්තිය උදෙසා ස්ත්‍රීවාදී එකමුතුවේ (FCEJ) ප්‍රතිචාරය

**මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (MMDA) ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවයක් නැති බවට ජාතික ජන බලවේගයේ අමාත්‍ය විජිත හේරත් දැක්වූ අදහස් මුළුමනින් වැරදි සහ පදනම් විරහිත ප්‍රකාශයක් ලෙස අපගේ සාමූහිකය ප්‍රතික්ෂේප කරයි.** අප එම අදහස් දැක්වීම තරයේ හෙළා දකින අතර දශක ගණනක් තිස්සේ මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (MMDA) හේතුවෙන් සිදු වන වෙනස් කොට සැලකීම් සහ විවිධ ස්වරූපයේ ප්‍රචණ්ඩත්වයන්ට එරෙහිව පෙනී සිටින අපගේ සාමූහිකය තුළ මෙන්ම ඉන් පිටත සිටින මුස්ලිම් ක්‍රියාකාරිනියන් සමඟ සහෝදරත්වයෙන් සිටගන්නෙමු. NPP ආණ්ඩුවේ මෙම ප්‍රකාශය මෙන්ම පෙර සිටි ආණ්ඩුවල සහ දේශපාලන පක්ෂවල මේ හා සමාන ප්‍රකාශයන්, මුස්ලිම් ස්ත්‍රීන් සහ ගැහැනු ළමුන්ගේ ජීවන අත්දැකීම් මත පදනම්ව MMDA ප්‍රතිසංස්කරණ අරබයා කෙරෙන යුක්තිසහගත ඉල්ලීමට අවමන් කිරීමකි. MMDA ප්‍රතිසංස්කරණ සඳහා වූ අරගලය දීර්ඝ කාලීන අරගලයක් වනවා පමණක් නොව එය ක්‍රියාකාරිනියන්ට සිදුවන තර්ජන, අපවාද, සහ හිංසනයන් හමුවේ නොසැලී පවතින අරගලයකි. අමාත්‍යවරයාගේ ප්‍රකාශයෙන් අප විශේෂයෙන් වික්ෂිප්ත වන්නේ NPP හි ප්‍රධාන පාර්ශවකරුවකු වන ප්‍රගතිශීලී ස්ත්‍රී එකමුතුව (PWC) MMDA ප්‍රතිසංස්කරණයන්ට සහයෝගය පළ කර ඇති හේතුවෙන් සහ "පොහොසත් රටක් ලස්සන ජීවිතයක් (2024)" නම් වූ NPP ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි ම ස්ත්‍රීන් වෙනස් කොට සැලකීමට ලක්වන නීති සංශෝධනය කරන බවට ලබා දී ඇති ප්‍රතිඥාව හේතුවෙන් ය.

**පවුල් සංස්ථාව තුළ සිදුවන අසාධාරණයන්ට එරෙහිව සමාජ පරිවර්තනයක් සඳහා සටන් කිරීමට ඉඩ ප්‍රස්ථාව නිර්මාණය කරන පවුල් නීති ප්‍රතිසංස්කරණයන්ගේ අවශ්‍යතාවය ස්ත්‍රීන්ගේ ආර්ථික අයිතීන්, යුක්තිය හා ආරක්ෂාවෙහි කේන්ද්‍රයේ පවතින අතර ඍජුව සම්බන්ධිත ය.** විශේෂයෙන්ම, පවුලේ මූල්‍යමය කටයුතු සම්බන්ධයෙන් ස්ත්‍රීන්ට තීරණ ගැනීමේ හැකියාව; සිය උරුමයෙන් ලැබෙන මෙන්ම විවාහයෙන් ලැබෙන මූල්‍ය සම්පත් සහ වත්කම් වලට ස්ත්‍රීන්ට සාධාරණ ප්‍රවේශය; ස්ත්‍රීන්ගේ ප්‍රජනක ස්වාධීනත්වය, සහ දරිද්‍රතාවය හා අනෙකුත් සාධකයන්ගේ සන්දර්භයක් තුළ දරුවන් රැක බලාගැනීම සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය, MMDA වැනි නීති බලපවත්වනා පවුල් ව්‍යුහය මඟින් තීරණය වේ. MMDA වැනි නීති මඟින් තහවුරු කරන පුරුෂාධිපති සමාජ ව්‍යුහයන් තුළ ස්ත්‍රිය බලහත්කාර මූල්‍යමය යැපීමක ජීවත් වන අතරම ණය බරෙන් මෙන්ම ශ්‍රී ලංකා රජය හා IMF විසින් නියම කරනු ලබන සුබසාධන කප්පාදු නිසාවෙන් පීඩාවට පත්ව ඇත. ස්ත්‍රිය වෙනස් කොට සැලකීමට ලක් කරන පවුල් නීති මඟින් මෙම පීඩාව තවදුරටත් උග්‍ර කරන අතර රට ගොඩගැනීමේ සහ සුබසාධන කප්පාදුවල නාමයෙන් ශ්‍රී ලංකා රජය සහ IMF ස්ත්‍රීන්ගේ පීඩනය අවශ්‍යයෙන්ම පවත්වාගනී. වෙනත් වචන වලින් කියන්නේ නම්, එය ජාතික ණය බරෙන් ගොඩ ඒමට ස්ත්‍රීන්ගේ සහ ගැහැනු ළමුන්ගේ යහපැවැත්ම බිල්ලට දීමකි.

**රටේ ආර්ථික ස්ථාවරත්වයේ පදනම වන්නේ ස්ත්‍රීන් සඳහා වන ආර්ථික යුක්තිය බව පාර්ලිමේන්තු නියෝජනයට සූදානම් වන සියලුම අපේක්ෂකයින්ට අප සිහි කර දෙන්නට කැමති ය.** රජය සහ ජනතාව අතර විශ්වාසය බිඳවැටීමට තුඩු දෙන ලෙස තමන්ගේම මැතිවරණ පොරොන්දු අමු අමුවේ උල්ලංඝණය කිරීම යනු, ආර්ථික අර්බුදයන්ට හේතු වන සහ නැවත නැවතත් අර්බුදයට යවන්නට හේතු වන දේශපාලන අස්ථාවරත්වය නිර්මාණය කරන දේශපාලන භාවිතය ම බව අපි සියලු අපේක්ෂකයින්ට මතක් කරන්නෙමු. **සියලු විශ්වාසයන්ට අයත් ශ්‍රී ලාංකීය ස්ත්‍රීන් ක්‍රම වෙනසක් වෙනුවෙන් පැහැදිලි ඉල්ලීමක් මේ වන විට ඉදිරිපත් කර ඇත. මුස්ලිම් විවාහ හා දික්කසාද පනත වහා ප්‍රතිසංස්කරණය කරනු!**

2024 නොවැම්බර් 10 වැනිදා

*ආර්ථික යුක්තිය වෙනුවෙන් ස්ත්‍රීවාදී එකමුතුව යනු ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථිකය තුළ ඔවුන් සමඟ වැඩකරන ප්‍රජාවන්ගේ සැබෑම අත්දැකීම් මත පදනම්ව ප්‍රතිපත්ති නිර්දේශ වටහා ගැනීමට, විශ්ලේෂණය කිරීමට සහ ප්‍රකාශ කිරීමට රටේ සියළු ප්‍රදේශවලින් 2022 අප්‍රේල් මස දී එක් වූ ස්ත්‍රීවාදී ආර්ථික විද්‍යාඥයන්, උගතුන්, ක්‍රියාකාරීන්, විශ්වවිද්‍යාල සිසුන් සහ නීතීඥයන් යන අයගේ එකමුතුවකි. කරුණාකර ඔබේ අදහස් මෙම විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කරන්න - feministcollectiveforjustice@gmail.com*